# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| දිනය Date | 2025.05.29 පැය 1355 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1097 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |
|---|---|---|---|---|---|---|---|


**2025 වර්ෂය තුල බහුදින ධීවර යාත්‍රා මඟින් දිවයිනට රැගෙන එන ලද මත්ද්‍රව්‍ය තොග පොලිස් භාරයට ගැනීම - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය.**

2025 වර්ෂය තුල මේ දක්වා කාලය තුල මුහුදු මාර්ගය ඔස්සේ බහුදින ධීවර යාත්‍රා මඟින් මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් විසින් අවස්ථා කිහිපයකදී මෙරටට මත්ද්‍රව්‍ය තොග ගෙන්වා ඇති අතර ශ්‍රී ලංකා නාවික හමුදාව හා පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය ඒකාබද්ධව සිදුකළ වැටලීම් මඟින් එම මත්ද්‍රව්‍ය තොග සැකකරුවන් සමඟ අත්අඩංගුවට ගැනීමට කටයුතු කර ඇත.

2025 වර්ෂය තුළ මේ ආකාරයෙන් මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් විසින් රැගෙන එන ලද මහා පරිමාණ මත්ද්‍රව්‍ය වැටලීම් 04 ක් සිදුකර ඇති අතර එමඟින් හෙරොයින් මත්ද්‍රව්‍ය කිලෝ 542 කට ආසන්න ප්‍රමාණයක් සහ අයිස් මත්ද්‍රව්‍ය කිලෝ 1216 කට ආසන්න ප්‍රමාණයක් එම කාර්යාංශය මඟින් අත්අඩංගුවට ගෙන ඇත.

ඒ අනුව මේ වර්ෂය තුළ බහුදින ධීවර යාත්‍රා සම්බන්ධ මහා පරිමාණ මත්ද්‍රව්‍ය වැටලීම් වලට අදාල විස්තර පහත පරිදි ඉදිරිපත් කරමි.

| අනු අංක | දිනය | හෙරොයින් කිලෝග්‍රෑම් | අයිස් මත්ද්‍රව්‍ය කිලෝග්‍රෑම් |
|---|---|---|---|
| 01 | 2025.04.05 | 191 | 671 |
| 02 | 2025.04.12 | 77 | 42 |
| 03 | 2025.05.28 | 166 | 253 |
| 04 | 2025.05.28 | 108 | 250 |
| **මුළු ප්‍රමාණය** | | **542** | **1216** |

මේ දක්වා සිදුකර ඇති වැටලීම් මඟින් සැකකරුවන් 22 ක් හා බහුදින ධීවර යාත්‍රා 04 ක් පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය මඟින් අත්අඩංගුවට ගෙන ඇත. ඉදිරි විමර්ශන මත්ද්‍රව්‍ය කාර්යාංශය මඟින් සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**